**මහව ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලිපි ද්‍රව්‍ය තොගවල අයිතම 05 වටිනාකම රු.346,642 ක් වැඩියෙන් ද අයිතම 05 ක වටිනාකම රු.20,120 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු විදුලි පංකා 4 ක වටිනාකම රු.68,400 ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පුස්තකාල පොත් වටිනාකම හා උපලේඛන ශේෂයන් අතර රු.308,747 ක වෙනසක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් සහ ඊට අදාළ උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත අත්තිකාරම් ගිණුම් විෂයය සඳහා අත්තිකාරම් ලේඛන හෝ වෙනත් ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 1,002,013 ක වටිනාකම විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අදාළ තොරතුරු සනාථ කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 134 වගන්තිය | සභාව විසින් සේවා සපයන සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කර වරිපනම් අයකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (ඇ) | මුදල් රෙගුලාසි 570 හා 571 | කල් ඉකුත් වූ වටිනාකම 6,774,863 ක් වූ තැන්පතු 209 ක් නියාදනය කර නොතිබුණි. | -එම- | රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා මුල හා පරිපාලන රීති | | | |
| (i) | 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර එය සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | -එම- | අදාළ රීති උපදෙස් ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ii) | 61 රීතිය | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබා ගන්නා ලැයිස්තුවේ ඇතුළත් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. බදු නොගෙවන කර්මාන්ත පිළිබඳව ලේඛනවල ඇතුළත් නොවූ අතර ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 218 රීතිය | පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂික ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත | අදාළ රීති උපදෙස් ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| (i) | අංක 2018/elocal government 01 හා 2018/07/19 දිනැති චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් කටයුතු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත | චක්‍රලේඛ නියමයන්ට අනුව ක්‍රියා කළ යුතුය |
| (ii) | අංක 2010/02 හා 2010/07/30 දිනැති චක්‍රලේඛයේ 1.2.ii. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරීන් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | අංක 03/2015 හා 2015/11/02 දිනැති චක්‍රලේඛය | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි | -එම- | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,802,960 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,387,653 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

**ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව** සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමින්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමින්) |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,569 | 5,457 | 4,605 | 852 | 5,432 | 5,520 | 4,138 | 1,382 |
| කුලී | 9,788 | 8,319 | 5,241 | 3,078 | 20,201 | 12,135 | 8,456 | 3,679 |
| බලපත්‍ර ගාස්තු | 728 | 633 | 633 | - | 830 | 545 | 545 | - |
| වෙනත් ආදායම් | 22,080 | 19,257 | 14,893 | 4,363 | 80,370 | 15,566 | 724 | 14,841 |
| එකතුව | 38,165 | 33,666 | 25,372 | 8,293 | 106,833 | 33,766 | 13,863 | 19,902 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු රු.1,454,674 ක් හිඟවපැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 වර්ෂය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,621,131 ක් හා මුද්දර ගාස්තු රු.6,431,597 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ ශේෂ කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව වාහන නවතා තැබීමේ ගාස්තු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණ ද , සභා බල ප්‍රදේශය තුළ ආදායම් එකතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සභා බල ප්‍රදේශය තුළ ආදායම් එකතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා එකතු වටිනාකම රු.1,500,000 ක් වූ අයවැයගත කර්මාන්ත 02 ක් සමාලෝචිත වර්ෂය තුළ නිම නොවී පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කඩිනමින් නිම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය හා පුනරාවර්තන වැය එකතුව රු. 11,793,037 ක් වුව ද දිරන කසළ හා නොදිරන කසළ අලෙවියෙන් ලද ආදායම රු.191,070 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 12 ක වටිනාකම රු.28,674,093 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතු වටිනාකම රු.23,251,680 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ විධිමත් පරිදි කඩිනමින් නිරවුල් කළ යුතු ය. |
| (ඇ) | වරිපනම් දේපල තක්සේරුව 2012 වර්ෂයෙන් පසු සිදු නොකිරීම මත සභාවට උපයාගත හැකිව තිබූ ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි | -එම- | ආදායම් නිසි ලෙස උපයා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 09 දෙනෙකු අදාළව රු.124,560 ක අය නොවන ණය ශේෂයන් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සේවක ණය ශේෂ අයකර ගත යුතුය. |

**3.3** **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු සහ සවි කිරීම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ස්ථාවර වත්කම් ලේඛනය තොරතුරු යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | සභාව සතු වීදි පහන් සියල්ල භෞතිකව අංකනය කර නොතිබුණු අතර වීදි පහන් පිළිබඳ තොරතුරු CAT පරිගණක පද්ධතියට ඇතුළත් කර නොතිබූ අතර වීදි වීදි පහන් පිළිබඳ ලේඛනය සහ සභාව විසින් නඩත්තු කරන නළ ළිංවල සහ ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු සභාව සතුව නොතිබුණි. | -එම- | වීථි පහන් ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |
| (ඇ) | සභාවට පවරා තිබූ සුසානභූමි 04ක වටිනාකම සහ කඳුරුගහමුල පිටිය ඉඩමෙහි සහ සායන මධ්‍යස්ථාන දෙකක වටිනාකම තක්සේරුගත කර ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ඉඩම් වටිනාකම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | සභාව විසින් නඩත්තු කරන වාහන 04 ක් , සුසාන භූමි 172 ක් සහ පොදු ළිං සහිත ඉඩම් 09 ක් සහ වටිනාකම රු.11,527,767 ක් වූ ඉඩම් 09 ක් සහ වටිනාකම තක්සේරු කර නොතිබූ ඉඩම් වත්කම් 20 ක් සභාව වෙත පවරා ගෙන නොතිබූ අතර, | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අයිතිය පවරා ගත යුතුය. |
| (ඉ) | සභාව විසින් න නඩත්තු කරන නළ ළිං 115 ක් අතුරින් 05 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | උපයෝජනයට යොදා ගත යුතුය. |
| (ඊ) | පිලිසරු මධ්‍යස්ථානයේ ඇති වටිනාකම රු.525,000 ක් වූ ට්‍රැක්ටර් 02 ක් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් අපහරණය සඳහා නිර්දේශ ලබා දී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 41 ක් හා අතිරික්ත 26 ක් පැවති අතර අනුමත කාර්යමණ්ඩල ඉක්මවා අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික දීමනා පදනම යටතේ බඳවා ගත් සේවකයින් 25 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අනුමත කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසර සංවධර්න ඉලක්ක

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු 09 ක් හඳුනා ගෙන තිබුණ ද, එම අරමුණු ළඟා කර ගැනීම සඳහා ඉලක්ක සහ දර්ශක විධිමත් පරිදි හඳුනාගෙන නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | තිරසර සංවර්ධන අරමුණු ලගා කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් ක්‍රමවේදයන් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |